**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**

මුදල් අමාත්‍යාංශය

(1997 අංක 20 දරණ පනත යටතේ ස්ථාපිත කරන ලදී.)

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පවතින පහත තනතුර සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **තනතුරු නාමය** : තොරතුරු තාක්ෂණ සහකාර

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව** : **02**

වැටුප් කේතය : MA 3 - 2016

වැටුප් පරිමාණය : රු. 32,200 - 445 X 10 - 660 X 11 - 730 X 10 - 750 X 05 - 54960 (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ.)

වයස : අවු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

2. බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්:

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක සේවා පළපුරුද්ද.

විශේෂ සුදුසුකම්:-

පුරප්පාඩු 02 පිරවීමේදී පහත දැක්වෙන විශේෂ සුදුසුකම් සහිත අය සඳහා ප්‍රමුඛතාව දෙනු ලැබේ.

- ASP.NET, C#, Java, පරිගණක ලේඛන භාෂාවල නිපුණත්වය සහ අවම වශයෙන් වසර තුනක පළපුරුද්ද,
- Design Patterns සහ Algorithm පිළිබඳව නිපුණත්වය
- SQL Server සහ MySQL යනාදී Database ආශ්‍රිතව වැඩ කිරීමේ හැකියාව
- Web Services සහ Cloud වැනි තාක්ෂණික ක්ෂේත්‍රයන් පිළිබඳ පළපුරුද්ද
- Secure Coding සහ Coding best practices පිළිබඳව දැනුම

හෝ

- VMware සහ Hyper-V භාවිතය පිළිබඳ වසරකට වැඩි පළපුරුද්ද
- Server (Window/Linux) Administration, Firewall, Router, Switches configuration පිළිබඳව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද
- Cyber Security පිළිබඳ දැනුම සහ හදිසි තත්වයන් කළමනාකරණය කිරීමේ හැකියාව (Incident Management) සහ පළපුරුද්ද මෙම තනතුර සඳහා විශේෂයෙන් සලකා බලනු ලැබේ.
- Application Server, Database Server සහ AD Configuration පිළිබඳ පළපුරුද්ද
- Cloud තාක්ෂණය පිළිබඳ පළපුරුද්ද

<u>පොදු කොන්දේසි :-</u>

3. තනතුර :- ස්ථිරය, විශ්‍රාම වැටුප් රහිත වන අතර තුන් අවුරුදු පරිවාස කාලයට යටත් වේ.

4. වෙනත් :- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5. තෝරා ගැනීමේ ක්‍රමය :-

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රසිද්ධ දැන්වීමක් හෝ පුවත්පත් දැන්වීමක් මඟින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරඟ විභාගයක හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිපල මත තෝරා ගැනීමෙන් බඳවා ගැනීම් සිදු කෙරේ.

6. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :-** **2019.09.23**

සියළු අධ්‍යාපන සහතික, වෘත්තීය සුදුසුකම් දක්වන සහතික හා සේවා පළපුරුද්ද පිළිබඳ සහතික වල, සහතික කරන ලද පිටපත් සමඟ අයදුම්කරුවන් විසින් සකස් කර ගන්නා ලද අයදුම්පත්‍රයක් **2019.09.23** දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතු අතර, අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය. නැතහොත් අයදුම්පත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මානව සම්පත් හා පරිපාලන අංශයේ තබා ඇති පෙට්ටියට ගෙනවිත් බහාලිය යුතු වේ. (අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / අනෙකුත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.)

**සභාපති / ප්‍රධාන විධායක**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02